**ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවත්,

(ආ) ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මවිසින් ඉදිරිපත් නර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.6.1 මූලධන වියදම්**

---

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාහන අනතුරු හේතුවෙන් සිදුවූ පාඩු මූලධන වියදම් යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් රු.522,245 කින් අධිගණනය වී තිබුණි. | අනතුර සිදුවූ වර්ෂයේදීම රක්ෂණ මුදල් ලැබීම නිසා අදාල වර්ෂයේදි වැය ලෙජරයට හර නොකොට මුදල් රෙගුලාසි107(3) ප්‍රකාරව, ආදායම් ගිණුමට එකතු කරන ලදි. | වාහනවලට අනතුරු හේතුවෙන් සිදුවූ පාඩු මුදල් රෙගුලාසි අනුව ගිණුම්ගත කළ යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 ආදායම් කළමනාකරණය**

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය පරිපාලන හා කළහනාකරණ අමාත්‍යාංශයේ අංක 04/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව රජයේ නිල නිවාසයක පවුලක් සමග ජීවත් වන පරිපාලන නිලධාරියෙකුගේ මාසික මූලික වැටුපෙන් සියයට 12.5ක් අයකළ යුතු වුවත්, 2010 වර්ෂයේ සිට ආර්ථික කුලිය පමණක් එක් නිලධාරියෙකුගෙන් අයකිරීම හේතුවෙන් රජයට අහිමි වූ ආදායම රු.295,652ක් විය. | අදාල නිලධාරියාගේ නිවාස කුලිය ආයතන සංග්‍රහයේ සහ චක්‍රලේඛයට අනුකූලව 2021 ජනවාරි මාසයේ සිට අයකිරීමට කටයුතු කරමින් පවති. | චක්‍රලේඛ උපදෙස් අනුව අයකළ යුතු කුලිය ලබා ගත යුතුවේ. |

## 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේදීත් ක්‍රියාකාරි සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම ආදිය පිළියෙල කර ඇති අතර මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව අධිකාරි බලය පැවරීම සකස් කර ඔබ වෙත පිටපතක් එවීමට නියමිත නිලධාරියා දැනුවත් කර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2.3 තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 215 වගන්තියේ 3 (අ) ප්‍රකාරව, ගෙවීම් සිදුකිරීමට අපේක්ෂා කරනු ලබන ගෙවීමක් කරන විට එය වෙනමම තැන්පතු ගිණුමට මාරුනොකරන ලෙස සඳහන් කර ඇති නමුත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් විසින් ඊට පටහැනිව අංක 6000-0-0-13-0-66 දරන ශීර්ෂය යටතේ රු.10,133,552ක ගෙවීම් සිදු කර තිබුණි. | ඉදිරියේදි මෙවැනි ක්‍රියාවන් සිදුනොවන අයුරින් කටයුතු කරනු ලැබේ. | තැන්පතු සම්බන්ධයෙන් වූ මුදල් රෙගුලාසි විධිවිධාන අනුගමනය කළ යුතුවේ. |

## 2.4 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියාත්මකව පවතින නමුත් නිවාඩු දින සහ සතිඅන්ත දිනවල ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් නොතබා අතිකාල දීමනා සහ නිවාඩු දින දීමනා ලෙස රු.1,206,229ක් ගෙවා තිබුණි. | ඉදිරියේදී මෙම වැරදි නොවන අයුරින් කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඇඟිලි සලකුණු සටහන් පදනම් කරමින් ගෙවීම් කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ දූර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රු.මිලියන 4.6ක මූල්‍ය ප්‍රතිපාදනයෙන් ඉදි කරනු ලැබූ මන්මුනේ දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයට අයත් පෙරිය කල්ආරු වෙරළ උද්‍යානයේ නඩත්තු කටයුතු කොන්ත්‍රාත්කරු විසින් සිදු නොකර තිබුණු අතර එහි සවිකරනු ලැබූ රු.2,351,250ක් වටිනා අයිතමයන් කැඩී බිඳී ගොස් තිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කොන්ත්‍රාත්කරු සහතික වුවත්, Covid 19 වාතාවරණය හේතුවෙන් අළුත්වැඩියා කටයුතුවල ප්‍රමාදයන් සිදු වී තිබේ. | වැඩබිම් නඩත්තු සේවාවන් කොන්ත්‍රාත්කරු ගේ වගකීම් කාලය තුළ ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 03 වගන්තිය ප්‍රකාරව තනතුරේ ස්වභාවය අනුව රජයේ නිවාස ලබාදී නොතිබුණු අතර පොරොත්තු ලේඛනයේ සිටින අයට ප්‍රමුඛස්ථානය ලබා නොදී නිවාස වෙන්කර තිබුණි. තවද අඛණ්ඩව වර්ෂ 05ක් ඉක්මවූ බදු ගිවිසුම් අවසන් කිරිමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර කුලි දඩ ගාස්තු ද අයකර නොතිබුණි. | ඉදිරියේදි මේවා විධිමත් කර ලබාදීමට කටයුතු කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව නිවාස කුලී නැවත තක්සේරු කිරීම සහ දඩ ගාස්තු අයකිරිමද කළ යුතුවේ. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරිගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| (අ) ග්‍රාමීය ආර්ථික වර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන් සඳහා කෝරලෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු. මිලියන 13ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දී තිබූ නමුත්, එම වැඩසටහන්වලට අදාල ප්‍රතිලාභීන් තේරීමේ ක්‍රියාවලියේ පැවැති අඩුපාඩු හේතුවෙන් අදාල ව්‍යාපෘතිවල නිමවුම් මට්ටම ළඟාකර ගෙන නොතිබුණි. | ව්‍යාපෘති දෙකක් මගින් ජීවනෝපාය ආධාර ලබාගත් ප්‍රතිලාභීන්ගෙන් එක් ව්‍යාපෘතියකින් ලබාදුන් භාණ්ඩ, ආපසු ලබාගෙන මේ දක්වා රජයේ ව්‍යාපෘති මගින් ජීවනාධාර ලබානොගත් ප්‍රතිලාභීන්ට ලබාදීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රතිලාභ ඵලදායීව බෙදී යන අයුරින් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ. |
| (ආ) ඒකාබද්ධ ජාතික සහයෝගිතා වැඩසටහන යටතේ කෝරලෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු. 250,520ක් ලබාදී නිවාස ආර්ථික අභිවෘද්ධිය අරමුණු කොටගෙන ප්‍රතිලාභීන් 28,844 දෙනෙකුට පළතුරු පැළ සහ ධාන්‍ය පැළ ලබාදී තිබූ නමුත් පළතුරු සහ ධාන්‍ය පැළ විශාල ප්‍රමාණයක් විනාශයට පත්වී තිබුණි. | වැස්ස හේතුවෙන් විනාශ වූ පැළ නැවත පැළ කරමින් පවතින අතර නඩත්තු කිරීමට උපදෙස් ලබාදී ඇත | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සුදුසු කාලය සහ ප්‍රතිලාභියාගේ හැකියාව පිළිබඳ තොරතුරු සැලකිල්ලට ගෙන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ. |

### 3.3 අපේක්ෂා කළ ප්‍රතිඵල ලබානොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ආර්ථිකය ශක්තිමත් කිරීමේ සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ඒරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෙළෙඳ පොල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 16.96ක ප්‍රතිපාදන සලසා තිබුණ ද. යෝජිත සැලැසුම වෙනස් වීම මත පිරිවැය රු.2,608,321ක ඉදිනිරීම් සිදුකර නොතිබුණු අතර ගොඩනැගිල්ල ඵලදායීව භාවිතයට ගෙන ද නොතිබුණි . | ජල සැපයුම් පද්ධතියේ අළුත්වැඩියා කටයුතු සිදුකර ජලය සැපයීමට සූදානම් වූ අවස්ථාවේදි Covid – 19 වාතාවරණය නිසා ක්‍රියාකාරකම්වල ප්‍රමාදයන් සිදුවී තිබේ. | අදාල ව්‍යාපෘතියේ ඉලක්ක ළඟාකර ගැනීමට හැකි අයුරින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුවේ. |

### 3.4 ව්‍යාපෘතිය ඉටු නොකර අත්හැර දැමීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| කර්මාන්ත අමාත්‍යාංශයේ "නංවමු ලංකා වැඩසටහන" යටතේ කර්මාන්ත ව්‍යවසායකයන් දිරිගැන්වීමේ වැඩසටහන සඳහා 2019 වර්ෂයේදි කෝරලෙයිපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොටඨාශයේ ව්‍යවසායකයන් 79ක් දිරිගැන්වීම වෙනුවෙන් රු.1,705,000ක මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබූ නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් තේරීමේදී සිදු වූ අඩුපාඩු මත මෙම වැඩසටහන අත්හැර දමා තිබුණි. | මුදල් අමාත්‍යාංශයේ අංක BD/GPS155/09/01/HA-2019 දරන 2019 නොවැම්බර් 20 දිනැති ලිපියෙහි උපදෙස් ප්‍රකාරව මෙම ව්‍යාපෘතියට අදාල සියළුම මෙහෙයුම් අත්හිටුවන ලදි. | මූල්‍ය ප්‍රතිපාදන සලසන ලද වැඩසටහන් නියමිත කාලවකවානු තුළ ඉටු කිරීමට පියවර ගත යුතුවේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුරප්පාඩුව පවතින ග්‍රාම සේවා නිලධාරි තනතුරු 97ක් සහ කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 39ක් සඳහා ස්ථිර නිලධාරීන් බඳවා නොගැනීම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ එහි වසම්වල පරිපාලන කටයුතු මන්දගාමී තත්වයක පැවැතුණි. | මෙයට සුදුසු නිලධාරීන් පත්කරනු ලැබූ විට මෙම පුරප්පාඩු නැවත පිරවීම සිදුකරනු ලැබේ. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය |
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලයට පරිභාහිරව සංවර්ධන නිලධාරීන් 106 ක් බඳවාගෙන තිබුණි | තනතුරු සංඛ්‍යාව වැඩි කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | අනුමත සේවක සංඛ්‍යාවට අනුකූලව බඳවාගැනීම් සිදු කළ යුතුවේ. |